Uva Wellassa University

## ජාතික සංවර්ධනයට සාඩම්බර ලෙස දායකවන්න

# ඇබෑර්තු - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

### 01. තනතුර : සංඛ්‍යාලේඛන නිලධාරී, II ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ගණිතය හෝ සංඛ්‍යානය විෂයක් ලෙස ඇති පළමු පන්තිය හෝ දෙවන පන්තියේ ඉහළ පෙළ විශේෂ / සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

හෝ

02. ගණිතය / සංඛ්‍යානය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ 30 සහිතව සංඛ්‍යානය පිළිබඳ වසරක කාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

හෝ

03. සංඛ්‍යානය පිළිබඳ සමාන ස්වභාවයේ සුදුසුකම් ලබා තිබීම.

**සටහන :** සංඛ්‍යානමය කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමි වේ.

යෝග්‍යතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ.

### 02. තනතුර : පරිපාලන (භූමි දර්ශන) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් කෘෂිකර්මය හෝ කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය සහ ප්‍රධාන වශයෙන් භෝග විද්‍යාව / උද්‍යාන විද්‍යාව / මල් වගාව / වන විද්‍යාව පිළිබඳ වසර හතරක විශේෂ (ගෞරව) ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග රාජ්‍ය / සංස්ථාවක හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක භූමි අලංකරණය පිළිබඳ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසරකට (01) නොඅඩු පළපුරුද්දක් තිබීම.

හෝ

02. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් භූ දර්ශන නිර්මාණ ශිල්පය (Landscape Architecture) පිළිබඳ වසර හතරක විශේෂ (ගෞරව) ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග රාජ්‍ය / සංස්ථාවක හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක භූමි අලංකරණය පිළිබඳ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසරකට (01) නොඅඩු පළපුරුද්දක් තිබීම.

හෝ

03. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උද්භිද විද්‍යාව පිළිබඳ වසර හතරක විශේෂ (ගෞරව) ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග රාජ්‍ය / සංස්ථාවක හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක භූමි අලංකරණය පිළිබඳ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් තිබීම.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ.

### 03. තනතුර : ව්‍යාපෘති කළමනාකරු

**සුදුසුකම් :**

01. සිවිල් ඉංජිනේරු විද්‍යාව විශේෂිත වූ B.Sc (Eng) උපාධිය

හෝ

ප්‍රමාණ සමීක්ෂණය විශේෂිත වූ B.Sc උපාධිය

හෝ

සමාන වෘත්තීය සුදුසුකම්

සහ

02. පිළිගත් ඉංජිනේරු ආයතනයක ආයතනික සාමාජිකත්වය

හෝ

පිළිගත් ප්‍රමාණ සමීක්ෂණ ආයතනයක ආයතනික සාමාජිකත්වය

සහ

03. ඉදිකිරීම් ව්‍යාපෘති කොන්ත්‍රාත් මෙහෙයවීම මෙන්ම සෘජු ශ්‍රමය කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක අදාළ පළපුරුද්ද

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ.

### 04. තනතුර : සහකාර ජාල කළමනාකරු II ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යා / පරිගණක ඉංජිනේරු ප්‍රථම පන්තියේ හෝ දෙවන පන්තියේ B.Sc විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ

02. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු B.Sc විශේෂ උපාධියක් සමත් වී තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂයක් ලෙස ඇති පළමු හෝ දෙවන පන්තියේ B.Sc සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

සහ

(ආ) පරිගණකකරණ / ජාලකරණ ක්ෂේත්‍රයේ වසර එකක පළපුරුද්ද

හෝ

03. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, පරිගණකරණය විෂයක් ලෙස ඇති B.Sc සාමාන්‍ය උපාධියක් සමත් වී තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ B.Sc සාමාන්‍ය උපාධියක් (පරිගණකකරණය විෂය අංගයක් නොවන) ලබා තිබීම

සහ

(ආ) පරිගණකකරණ / ජාලකරණ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

හෝ

04. පිළිගත් විශ්වවිද්‍යාලයකින් B.Sc. සාමාන්‍ය උපාධියක් (පරිගණකකරණය විෂය අංගයක් නොවන) සමත් වී තිබීම

සහ

පරිගණකකරණ / ජාලකරණ ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද

හෝ

05. වෙනත් ඕනෑම උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාතිබීම

සහ

පරිගණකකරණ / ජාලකරණ ක්ෂේත්‍රයේ වසර එකක පළපුරුද්ද

හෝ

06. විශ්වවිද්‍යාල සේවයේ පරිගණක වැඩසටහන් සම්පාදකයකු (Computer Programmer) ලෙස වසර 15 ක පළපුරුද්දක් තිබීම

යෝග්‍යතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ.

### 05. තනතුර : ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක III ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ඇති ජාතික කණ්ඩායමක සාමාජිකයකු වීම / ජාතික ශූරයකු වීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ක්‍රීඩා ක්ෂේත්‍රයේ වෙනත් සමාන ජයග්‍රහණ ලබා තිබීම

හෝ

02. අ.පො.ස. (උ/පෙ) විභාගය එක් පෙනීසිටීමකදී සමත් වී තිබීම සහ ඕනෑම ක්‍රීඩාවකින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මට්ටමෙන් නියෝජනය කර තිබීම සමග එම ක්‍රීඩාවෙහි වසර පහක (05) පළපුරුද්ද

හෝ

03. අ.පො.ස. (උ/පෙ) විභාගය එක් පෙනී සිටීමකදී අවම වශයෙන් විෂයන් 03 ක් සමත් වී තිබීම සහ මාස 09 කට නොඅඩු කාලයක ක්‍රීඩා ඩිප්ලෝමාවක් ලබා තිබීම සමග ක්‍රීඩා වැඩසටහන් සංවිධානය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වසර පහක (5) පළපුරුද්ද.

**සටහන :**

- අවස්ථානුකූලව ක්‍රීඩා / සංවිධානයක පාලක මණ්ඩලයෙන් වසර පහක (5) පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
- ඉහත සුදුසුකම් (1) යටතේ සඳහන් කර ඇති ක්‍රීඩා ක්ෂේත්‍රයේ වෙනත් සමාන ජයග්‍රහණ ඇති අපේක්ෂකයින්, එවැනි සුදුසුකම් UGC විසින් අනුමත කර ඇත්නම් සලකා බලනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ.

### 06. තනතුර : පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යා / පරිගණක ඉංජිනේරු පළමු හෝ දෙවන පන්තියේ B.Sc විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ

02. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යා / පරිගණක ඉංජිනේරු B.Sc විශේෂ උපාධියක් සමත් වී තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂයක් ලෙස ඇති පළමු හෝ දෙවන පන්තියේ B.Sc. සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

සහ

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසර එකක පළපුරුද්ද

හෝ

03. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂයක් ලෙස ඇති B.Sc. සාමාන්‍ය උපාධියක් සමත් වී තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ B.Sc. සාමාන්‍ය උපාධියක් (පරිගණකකරණය විෂය අංගයක් නොවන) ලබා තිබීම

සහ

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

හෝ

04. පිළිගත් විශ්වවිද්‍යාලයකින් B.Sc. සාමාන්‍ය උපාධියක් (පරිගණකරණය විෂය අංගයක් නොවන) සමත් වී තිබීම

සහ

පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද

05. වෙනත් ඕනෑම උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

සහ

පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

සම්මුඛ පරීක්ෂණයක් සහ යෝග්‍යතා පරීක්ෂණයක් මගින් තෝරාගැනීම සිදු කෙරේ.

### වැටුප් හා දීමනා (2025.01.01 දිනට)

- **සංඛ්‍යාලේඛන නිලධාරී තනතුර II ශ්‍රේණිය**
  U - EX 1 (IV)
  රු. 85,305 - 3 x 2,020 - 91,365 (EB) 93,765; 12 x 2,400 - 122,565 මාසිකව (2025.01.01 දිනට)
- **පරිපාලක (භූමි දර්ශන) තනතුර III ශ්‍රේණිය**
  U - EX 1 (II)
  රු. 85,305 - 3 x 2,020 - 91,365 (EB) 93,765; 12 x 2,400 - 122,565 මාසිකව (2025.01.01 දිනට)
- **ව්‍යාපෘති කළමනාකාර තනතුර**
  U - EX 1 (II)
  රු. 85,305 - 3 x 2,020 - 91,365 (EB) 93,765; 12 x 2,400 - 122,565 මාසිකව (2025.01.01 දිනට)
- **සහකාර ජාල කළමනාකාර තනතුර II ශ්‍රේණිය**
  U - AS 2 (II)
  රු. 85,305 - 3 x 2,400 - 92,505 (EB) 94,905 - 14 x 2,400 - 122,505 මාසිකව (2025.01.01 දිනට)
- **ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක තනතුර III ශ්‍රේණිය**
  U - AS 1 (II)
  රු. 68,145 - 18 x 1,190 - 89,565 මාසිකව (2025.01.01 දිනට)
- **පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක තනතුර II ශ්‍රේණිය**
  U - AS 2 (II)
  රු. 85,305 - 3 x 2,400 - 92,505 (EB) 94,905 - 14 x 2,400 - 128,505 මාසිකව (2025.01.01 දිනට)

ඊට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ වන රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ. පත්වීමේ කොන්දේසි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූල වන අතර එහි පසුකාලීන සංශෝධන සහ ආඥාපනත්, රෙගුලාසි, රීති ආදිය යටතේ සිදු කෙරේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත තනතුරට අදාළ අනෙකුත් සියලුම ප්‍රතිලාභ අදාළ වේ.

### අනෙකුත් කොන්දේසි :

01. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
02. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
03. නිර්දේශිත ආකෘතියෙන් යුත් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකයන්හි සහතික කළ පිටපත් සමග සහ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහිතව 2025.09.16 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, මානව සම්පත් අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
04. අයදුම්පත් ආකෘති සහ ගූගල් පෝරම සහ අදාළ තොරතුරු විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන http://www.uwu.ac.lk වෙතින් බාගත කරගත හැක.
05. වැදගත් : අතිරේකව ඔබගේ අයදුම්පත් ගූගල් පෝරමය හරහා ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පෙර පහත සඳහන් ගූගල් පෝරමය වෙත ඔබගේ අයදුම් පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් උඩුගත කළ යුතුය.

    https://forms.gle/TLGporGuhjD2vWXLA
06. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අදාළ තනතුර සඳහන් කළ යුතුය.
07. අසම්පූර්ණ අයදුම්පත්, සහායක ලේඛන නොමැති අයදුම්පත් සහ භාරගැනීමට නියමිත අවසන් දිනයෙන් පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ සහ එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.
08. වැඩිදුර පැහැදිලි කර ගැනීම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, මානව සම්පත් අංශය 055-3128945 / 055-3128944 හෝ recruitment@uwu.ac.lk වෙතින් ලබාගත හැක.

**වැඩ බලන ලේඛකාධිකාරී,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,**
**පස්සර පාර, බදුල්ල.**
**055-2226441**
**2025.08.14**